# ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව

## බටහිර සංගීත ප්‍රායෝගික විභාගය - 2019

## I වන ශ්‍රේණිය සිට VIII වන ශ්‍රේණිය දක්වා සහ ඩිප්ලෝමා

ඉංග්‍රීසි මාධ්‍යයෙන් පවත්වන ඉහත විභාගය සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ. 2019 අගෝසතු මස 19 වන දින සිට ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ වෙබ් අඩවියෙන් (www.doenets.lk), අයදුම්පත් ලබාගත හැකි අතර තැපෑලෙන් හා පැමිණ ඉල්ලූ විටද නිකුත් කරනු ලැබේ.

අයදුම්පත් තැපෑලෙන් ලබාගැනීමට අවශ්‍ය අයදුම්කරුවන් නම සහ ලිපිනය ලියූ රුපියල් 15.00 ක වටිනාකමකින් යුත් වලංගු මුද්දර ඇලවූ 9" x 4" ප්‍රමාණයේ ලියුම් කවරයක් පහත සඳහන් ලිපිනයට 2019 අගෝස්තු මස 31 වන දිනට පෙර ලැබෙන සේ එවිය යුතුය.

පැමිණ අයදුම්පත් ලබාගන්නා අයදුම්කරුවන්ට බත්තරමුල්ල, පැලවත්ත, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ විමසීම් කවුන්ටරයෙන් මෙම අයදුම්පත් 2019 සැප්තැම්බර් මස 20 වන දින දක්වා ලබාගත හැක.

සැ.යු. VI වන ශ්‍රේණිය සිට VIII වන ශ්‍රේණිය දක්වා සහ ඩිප්ලෝමා විභාගය සඳහා පෙනී සිටින අයදුම්කරුවන් අයදුම්පතේ ඉල්ලා සිටින සුදුසුකම් සහතිකවල පිටපත් ඇමිණිය යුතුය. තවද එම පිටපත් සත්‍ය පිටපත් බව අයදුම්පතේ අත්සන සහතික කරන නිලධාරියාගේ නිල මුද්‍රාව සහිතව සහතික කර ඉදිරිපත් කිරීම අනිවාර්ය වේ.

අයදුම්පත් භාරගන්නා අවසාන දිනය 2019 සැප්තැම්බර් මස 20 වන දින වේ. කවරයේ වම් පස ඉහළ කෙලවරේ විභාගයේ නම (බටහිර සංගීත ප්‍රායෝගික විභාගය - 2019) පැහැදිලිව සඳහන් කළ යුතුය.

සම්පූර්ණ කරන ලද අයදුම්පත් පහත ලිපිනයට තැපැල් මගින් එවීම හෝ පැමිණ භාරදීම කළ හැක.

ලිපිනය : විභාග කොමසාරිස් ජනරාල්,
සංවිධාන (ආයතනික හා විදේශ විභාග) ශාඛාව,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව,
තැ.පෙ.1503,
කොළඹ.

දුරකථන : 011 - 2785230
ෆැක්ස් : 011 - 2784232

**බී. සනත් පූජිත**
විභාග කොමසාරිස් ජනරාල්

**5/4/4/9/WMP/2019**
සංවිධාන (ආයතනික හා විදේශ විභාග) ශාඛාව,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව,
තැ.පෙ.1503, කොළඹ.
2019 අගෝස්තු මස19 වන දින.